**නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2019**

---

නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය අතර 2017 ජුලි 07 දින එළඹි අංක එස්එල්-පී 116 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යාස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, වර්තමානයේ රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 04 ක පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් මිනිසුන්ගේ ජීවන තත්ත්වයන් ඉහල නැංවීම හා ජීවනෝපාය සංවර්ධනය කිරීම වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 20,622 කට සමාන ජපන් යෙන් මිලියන 15,410 ක් වන අතර ඉන් රු.මිලියන 17,185 කට සමාන ජපන් යෙන් මිලියන 12,957 ක් මූල්‍යායනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජුලි 07 දින ආරම්භ කර තිබුණු අතර 2021 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | -------------- | ------------------ | ------------ | ---------------- | -------------- |
| (අ) | 2019 මාර්තු 05 දිනැති 2019/1 දරන කළමණාකරන සේවා චක්‍රලේඛයේ 9.3 | ව්‍යාපෘති සමාලෝචන කමිටු මාස 2කට වරක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත් | ව්‍යාපෘතියේ නියාමන කටයුතු කාර්යක්ෂමව ඉටු නොවීමට ඉඩ ඇත. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් නිරන්තරයෙන් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වගන්තිය | සමාලෝචිත වර්ෂය තුලදී රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි. | | | පැවැත්වීමට අවශ්‍යා වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756 හා 757 | සමාලෝචිත වර්ෂය තුලදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කර නොතිබුණි. | මූල්‍යා ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර වත්කම් සත්‍යාපනය කර නොතිබුණි. | හැකි විගස භෞතික සත්‍යාපනය සිදු කර අවසන් කරනු ලැබේ. | වර්ෂය අවසානයේදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කිරීම අවශ්‍යා වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබද භෞතික ප්‍රගතිය

| විගණන ගැටළුව | බලපෑම | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘති සංදේශයේ 16 ඇමුණුම අනුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුලදී උතුර,උතුරු මැද,නැගෙනහිර සහ ඌව පළාත්වල ග්‍රාමීය මාර්ග ඉදිකිරීම සහ පුනරුත්තාපනය සදහා උප ව්‍යාපෘති 224 ක්, වාරිමාර්ග පද්ධති ඉදිකිරීම හා පුනරුත්තාපනය සදහා උප ව්‍යාපෘති121ක් සහ ජල සම්පාදන යොජනා ක්‍රම වැඩි දියුණු කිරීමේ උප ව්‍යාපෘති 67ක් යටතේ කටයුතු සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත් උපදේශක පත්කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් අදාල කටයුතු 2019දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. | (අ) කටයුතු අවසන් කිරීමේ ප්‍රමාදයන්<br>(ආ) පිරිවැය ඇස්තමේන්තු ඉක්මවා යාම.<br>(ඇ) අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තු වන ප්‍රතිලාභ නොලැබීම. | අදියර 3ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු 2023 සැප්තැම්බර් 30 දිනට පෙර නිමකිරීමට සැලසුම් කර ඇත. | කටයුතු කඩිනම් කිරීමට වැඩ සැලැස්ම හදුනාගතයුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටළුව | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකයගේ නිර්දේශය |
|---|---|---|---|
| -------------------- | -------------- | -------------- | -------------- |
| (අ) ප්‍රමාදයන් සහිතව උපදේශකවරු දෙදෙනෙක් 2019 මාර්තු 27 හා 2019 ජුලි 15 දින පත්කර තිබුණි. කෙසේවෙතත් උපදේශන සේවා ගිවිසුම් වලට අනුව සති 34 ක් ඇතුලත වාර්තා ඉදිරිපත්කල යුතු වුවත් උප ව්‍යාපෘති 412ක විස්තරාත්මක සැලසුම් වාර්තාව 2020 ජුනි 30 දින තෙක් ඉදිරිපත් කර නොතිබුණි. තවද 2020 ජුනි 30 දින තෙක් උපදේශන කටයුතු සඳහා එකග වූ කාර්ය මණ්ඩලය යොදවා නොතිබුණි. ඊට අමතරව ජපන් ජාත්‍යන්තර සංවිධාන ආයතනයේ උපදේශනය සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව වැඩ අත්තිකාරම් මුදල් ගෙවීමෙන් පසු දින 14ක් ඇතුලත කටයුතු ආරම්භ කල යුතු වේ. කෙසේවෙතත් උතුරු පළාතේ ග්‍රාමීය මාර්ග 85ක සහ වාරිමාර්ග උප ව්‍යාපෘති 50 ක උපදේශන කටයුතු 2019 දෙසැම්බර් 31දිනට ආරම්භ කර නොතිබුණි. | (අ) කටයුතු අවසන් කිරීමේ ප්‍රමාදයන්<br>(ආ) පිරිවැය ඇස්තමේන්තු ඉක්මවා යාම<br>(ඇ) අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තු වන ප්‍රතිලාභ නොලැබීම | නියමිත කාලය තුල ජලසම්පාදන මණ්ඩලයේ අනුමැතිය නොලැබීම හේතුවෙන් නැගෙනහිර පළාතේ පානීය ජලය සම්බන්ධ සැලසුම් කිරීමේ කටයුතු ප්‍රමාද විය. මාර්ග සහ වාරිමාර්ග අදියර 1 හි සැලසුම් කිරීමේ කටයුතු 2020 මාර්තු 02 දින නිමකර ඇත. | කටයුතු නියමිත කාලයේදී අවසන් කිරීමට නියමිත කාලයේදී වාර්තා ඉදිරිපත් කිරීම අවශ්‍ය වන අතර ව්‍යාපෘති උපදේශන කටයුතු කඩිනම් කිරීමට උපදේශක පෙළඹවීමට අවශ්‍ය වේ. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් 5.4.4 (I) වගන්තියට එරෙහිව තාවකාලික මුදල සහ අසම්භාව්‍ය වියදම් ඇතුලත් කරමින් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම වූ රු.මිලියන 110.16ක් තීරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස උපදේශන ආයතනය වෙත රු.මිලියන11.56 ක මුදලක් අමතරව ගෙවා තිබුණි. | රජයට අතිරේක වියදමක් වේ. . | උපදේශක සේවයේ යෙදවීම සහ භාණ්ඩ සහ සේවා මිලදී සඳහා ජපන් ODA ණය යටතේ ප්‍රසම්පාදකන මාර්ගෝපදේශයේ විශේෂ කොන්දේසි 6.5 (අ) අනුව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම ගෙවා ඇත. | තාවකාලික මුදල සහ අසම්භාව්‍ය වියදම් රහිතව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 උපරිමයකට යටත්ව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම ගෙවිය යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගැටළු

| විගණන ගැටළුව | බලපෑම | කළමණාකරනයේ ප්‍රතිචාරය | විගණකයගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| උපදේශන සේවා ගිවිසුමේ පරිපාලන පොදු කාර්ය පිරිවැය ගෙවීම සඳහා ප්‍රතිපාදන ඇතුලත් කර නොතිබුණද රු.මිලියන 1.09ක මුදලක් පරිපාලන පොදු කාර්ය පිරිවැය ලෙස උපදේශන ආයතනයට ගෙවා තිබුණි. | උපදේශන සඳහ වන වියදමඉහල යාම | ගිවිසුමට අනුව ගෙවීම් සිදු කර ඇත. | ODA ණය යටතේ මිළදී ගැනීම් සඳහා වන මාර්ගෝපදේශයට අනුකූලව ගෙවීම් සිදුකල යුතුය. |

### 3.4 මානව සම්පත් කළමණාකරනය සම්බන්ධ ගැටළු

| විගණන ගැටළුව | බලපෑම | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකයගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ 2017 සැප්තැම්බර් 08 දිනැති ඩීඑම්එස්/ඞී/7777/ආර්අයිඩීර්පී දරණ ලිපියට අනුව ජොෂ්ඨ ඉංජිනේරු සහ මිළදී ගැනීම් විශේෂඥ පත්කර නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයක් ඇති වේ. | මෙම තනතුරු සඳහා තෝරාගත් නිලධාරීන් සේවයට වාර්තා කර නොතිබුණි.එමනිසා මෙම පුරප්පාඩු තනතුරුවල කටයුතු ව්‍යාපෘති කළමණාකරු නියෝජ්‍ය ව්‍යාපෘති කළමණාකරු විසින් ප්‍රමාධයකින් තොරව සිදු කරනු ලැබේ. | ව්‍යාපෘති කළමණාකරන ඒකකය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකවල මිළදී ගැනීම් කළමණාකරනය සඳහා වගකිවයුතු නිලධාරියෙකු සිටිය යුතුය. |

### 3.5 පද්ධති හා පාලනයන්

| විගණන ගැටළුව | බලපෑම | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකයගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘති සංදේශයට අනුව ව්‍යාපෘති කළමණාකරන ඒකකයේ මිළදී ගැනීම් විගණනය සඳහා අභ්‍යන්තර විගණක වගකියනු ඇත. කෙසේවෙතත් පෙර වර්ෂය තුළදී ප්‍රසම්පාදන විගණනයක් අභ්‍යන්තර විගණක විසින් සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර පාලන පද්ධතියේ දුර්වලතාවයන් අනාවරණයනොවේ. | වාර්ෂික කාර්යසාධන ඇගයීමේදී අභ්‍යන්තර විගණක වෙත දන්වා ඇත. | ව්‍යාපෘති සංදේශයට අනුව අභ්‍යන්තර විගණක ප්‍රසම්පාදන විගණනයක් සිදු කල යුතුය. |